C 377 SEN

# සිසුන් හදාරන විෂය ධාරාවලට අයත් විෂයයන් සඳහා යොදා ගන්නා වෙනස් ඉගෙනුම් ප්‍රවේශ පිළිබඳ අධ්‍යයනයක්

(ශ්‍රී ලංකාවේ මහනුවර දිස්ත්‍රික්කයේ අ.පො.ස. (උ. පෙළ) සිසුන් ඇසුරෙන්)

# A STUDY OF DIFFERENT LEARNING APPROACHES ADOPTED BY STUDENTS PERTAINING TO THE SUBJECTS IN DIFFERENT STREAMS

**(Study based on A/L students in the Kandy District, Sri Lanka)**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශනපති උපාධිය (අධ්‍යාපන විද්‍යා) සම්බන්ධයෙන්
අවශ්‍යතා අර්ධ වශයෙන් පූරණය කිරීම සඳහා ඉදිරිපත් කරන
පර්යේෂණාත්මක නිබන්ධනය (1994/96)

**එන්. සේනාරත්න**
**විද්‍යාවේදී උපාධි (සාමාන්‍ය)**
**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ඨ සම්මාන)**
**විද්‍යාපති**

නිබන්ධන උපදේශක
මහාචාර්ය එස්. ජේ. පෙරේරා මහත්මා
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය
ශ්‍රී ලංකාව

533971

## ABSTRACT


Learning approaches used by students in learning have been drawn current attention in the field of Educational Psychology. It is expected from this research to find out facts which have not been investigated so far, in this field.

The basic idea for this research was taken from the investigations made by Educational Psychologist, Biggs (1987).

His findings reveal that the three learning approaches deep, surface and achieving are used by students in the process of learning. In this research, the facts regarding these learning approaches have been investigated.

The methodology adopted was the use of a standard questionnaire, by which the learning approaches of students could be investigated. Learning Process Questionnaire (Biggs, 1987)was used for this purpose.

A sharp analysis of the learning approaches of students was made on the ideology of an Educational Psychologist, Eley (1992). Using this methodology, learning approaches of students in learning selected subjects in a particular stream have been investigated.

The Learning Process Questionnaire was adapted to suit Eley's methodology.

Using this methodology, the influence of subject context, school context as well as the influence of the personal factor, preference for the subjects on learning approaches were investigated.

A sample of 1124 G.C.E. (A/L) students including 561 males and 563 females was selected from the schools within Kandy Municipal Council Area.

Data obtained by administering questionnaire to the students have been analyzed. The following conclusions emerged through this analysis.

1. Learning approaches used by the students in learning selected subjects in a particular stream were found to be moderately significant.
2. The degree of adaptation shown by students while learning was high as 80%. The percentage of students that have not shown such adaptations was low.
3. Learning approaches of two groups of schools were compared. Very low amount of significant differences were found in learning selected subjects from different subject streams.
4. The significant differences fairly lower than the moderate level were found when students were learning the most preferred subject and the corresponding selected subject from different streams.

It revealed from this research that both contextual factors as well as personal factors influence learning approaches of students.

# සාරාංශය


මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කළේ අධ්‍යාපන මනෝ විද්‍යා ක්ෂේත්‍රයේ කාලීන අවධානය යොමු වී ඇති, සිසුන් ඉගෙනුම සඳහා යොදා ගන්නා ඉගෙනුම් ප්‍රවේශ පිළිබඳ මෙතෙක් අනාවරණය කර නොමැති කරුණු අනාවරණය කිරීම ය.

මේ සඳහා මූලික අදහස් Biggs (1987) නම් අධ්‍යාපන මනෝ විද්‍යාඥයාගේ සොයා ගැනීම්වලින් උපුටා ගෙන ඇත. ඔහු දක්වන පරිදි සිසුන් ඉගෙන ගැනීමේදී ගැඹුරු, පෘෂ්ඨීය හා සාධන යන ඉගෙනුම් ප්‍රවේශ යොදා ගනී. මෙම ඉගෙනුම් ප්‍රවේශ පිළිබඳ කරුණු මෙහිදී විමර්ශනයට ලක් වී ඇත.

පර්යේෂණය සඳහා යොදා ගත් ක්‍රම ශිල්පය වූයේ සම්මත ප්‍රශ්නාවලි භාවිතය යි. මෙම ක්‍රම ශිල්පය යොදා ගෙන සිසුන්ගේ ඉගෙනුම් ප්‍රවේශ අනාවරණය කර ඇත. මේ සඳහා Biggs (1987) ගේ ඉගෙනුම් ක්‍රියාවලි ප්‍රශ්නාවලිය (Learning Process Questionnaire) භාවිත කර ඇත.

Eley (1992) නම් අධ්‍යාපන මනෝ විද්‍යාඥයාගේ අදහස්වලට අනුකූල ව සිසුන්ගේ ඉගෙනුම් ප්‍රවේශ පිළිබඳ සියුම් විශ්ලේෂණයන් සඳහා මෙහිදී යොමු වී ඇත. ඒ අනුව විෂය ධාරාවන්ට අයත් තෝරා ගත් විෂය යුගලයන්ට සිසුන් දක්වන ගැඹුරු, පෘෂ්ඨීය හා සාධන යන ඉගෙනුම් ප්‍රවේශ අනාවරණය කර ඇත.

පර්යේෂණය සඳහා ඉගෙනුම් ක්‍රියාවලි ප්‍රශ්නාවලිය භාවිතයට පෙර Eley ගේ ක්‍රමවේදයට ගැළපෙන පරිදි අනුවර්තනය කරනු ලැබී ය.

සිසුන් දක්වන ඉගෙනුම් ප්‍රවේශවලට විෂය සන්දර්භය හා පාසල් සන්දර්භය බලපාන අවස්ථා යටතේ ද විෂය සඳහා ඇති කැමැත්ත යන සිසුන් තුළ පවතින සාධකය බලපාන අවස්ථාව යටතේ දඅනාවරණයන් කර ඇත.

නියැදිය ලෙස මහනුවර නගර සීමාව තුළ පාසල්වලින් අ.පො.ස.(උ.පෙළ) (13 වසර) ශිෂ්‍යයන් 561ක් හා ශිෂ්‍යාවන් 563 කින් යුත් 1124ක ශිෂ්‍ය පිරිසක් යොදා ගෙන ඇත.

ප්‍රශ්නාවලිය සිසුනට ඉදිරිපත් කිරීමෙන් ලබාගත් දත්ත, විශ්ලේෂණය කරන ලදී. එයින් ලත් ප්‍රතිඵල අනුව පහත සඳහන් නිගමනයන්ට එමට හැකි විය.

1. විෂයධාරාවනට අයත් තෝරාගත් විෂය යුගලකට සිසුන් දක්වන ඉගෙනුම් ප්‍රවේශ මධ්‍යස්ථ ප්‍රමාණයක වෙසෙසි වෙනස්කම් දක්වයි.
2. විෂය ධාරාවනට අයත් තෝරාගත් විෂය යුගල සඳහා ඉගෙනුම් ප්‍රවේශ අනුවර්තනයන් දැක්වූ සිසු පිරිස 80% ක් පමණ වූ ඉහළ ප්‍රතිශතයකි. සුළු පිරිසක් එසේ අනුවර්තනයන් නොදක්වා ඇත.
3. විෂය ධාරාවනට අයත් තෝරාගත් විෂය යුගලක් සඳහා සිසුන් දක්වන ඉගෙනුම් ප්‍රවේශ සම්බන්ධතා, පාසල් කාණ්ඩ අනුව ඉතා පහත් ප්‍රමාණයක් දක්වා ඇත.
4. විෂය ධාරාවනට අයත් තෝරා ගත් විෂය යුගලකින් පළමුවන කැමැත්ත සඳහන් කළ විෂය හා විෂය යුගලේ අනුරූප විෂය සඳහා යොදා ගත් ඉගෙනුම් ප්‍රවේශ, මධ්‍යස්ථ ප්‍රමාණයට තරමක් අඩු වෙසෙසි වෙනස්කම් ප්‍රමාණයක් දැක්විය.

පර්යේෂණයෙන් ලත් ප්‍රතිඵල අනුව සිසුන්ගේ ඉගෙනුම් ප්‍රවේශවලට සන්දර්භමය සාධක මෙන්ම සිසුන් තුළ පවතින සාධකද ආභාසයක් ඇති කරන බැව් පෙනේ.